අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Ministry of Education, Higher Education and Vocational Education
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026
General Certificate of Education (Ordinary Level) Examination - 2026

උපකාරක තක්සේරුව
உதவி மதிப்பீடு
Supportive Assessment

සිංහල මාධ්‍යය
சிங்கள மொழி மூலம்
Sinhala Medium

භූගෝල විද්‍යාව
Geography
புவியியல்



ප්‍රශ්න පත්‍රය I/II - வினாப்பத்திரம் I/II - Question Paper I/II

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
தேசிய மொழிகள் மற்றும் சமூக விஞ்ஞான கிளை
Ministry of Education, Higher Education and Vocational Education
National Languages and Humanities Branch

Past Papers Wiki

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

61	S	I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - උපකාරක තක්සේරුව - **2026**
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - பயிற்சி வினாத்தாள - 2026
General Certificate Examination (Ordinary Level) Examination – Supportive Assessment - 2026

භූගෝල විද්‍යාව	I, II
புவியியல்	I, II
Geography	**I, II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය	- මිනිත්තු **10** යි
மேலதிக வாசிப்பு நேரம்	- 10 நிமிடங்கள்
Additional Reading Time	- 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

භූගෝල විද්‍යාව - I

උපදෙස්:

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු** ම ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ** ම පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **හිත් ඉර මත ලියන්න.**

1. උන්නතාංශය සමග ..... වෙනස් වීමේ ස්වභාවය පදනම් කර ගෙන වායුගෝලය ස්තරවලට බෙදා ඇත.
(පීඩනය / උෂ්ණත්වය / ඝනත්වය)

2. යපස්, ගල් අඟුරු හා ..... නිධි බහුල රටවල මුල් කාලයේ දී යකඩ හා වානේ කර්මාන්තය ස්ථාන ගත විය.
(හුණුගල් / මිනිරන් / බනිජ වැලි)

3. ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් වැඩි වශයෙන් භාවිත කරනු ලබන්නේ ..... කටයුතු සඳහා ය.
(ගෘහස්ත / කාර්මික හා වාණිජ / ප්‍රවාහන)

4. ..... ළැව්ගිනි බහුල ව හට ගන්නා අග්නිදිග ආසියාතික රටකි.
(ඉන්දුනීසියාව / ඕස්ට්‍රේලියාව / චීනය)

5. කඳුකර තෙත් කලාපීය වනාන්තර ..... ට වැඩි උස් බිම්වල දක්නට ලැබේ.
(800m / 1200m / 1400m)


- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **'නි'** යන්න වටා ද, වැරදි නම් **'වැ'** යන්න වටා ද රවුමක් අඳින්න.

6. පහළ ප්‍රාවරණය හා පිටත හරය වෙන් කරන සීමාව ගුටෙන්බර්ග් අසන්තතිය යි. නි / වැ
7. මුළුමනින් ම ජීර්ණය වූ මව් පාෂාණ කොටස් හා ඓන්ද්‍රීය ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් B මහලෙහි දක්නට ලැබේ. නි / වැ
8. ලෝකයේ මිරිදිය පිරුණු විශාලතම විල ටිටිකාකා විල යි. නි / වැ
9. ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උද්‍යානය ගන්නොරුවේ පිහිටා ඇත. නි / වැ
10. පෘථිවිය දෙසට පැමිණෙන උල්කාෂ්ම මෙසෝගෝලයේ දී දැවී යයි. නි / වැ

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. පිලිපින දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිෆික් සාගරයේ ඇතිවන සුළි සුළං ..... ලෙස හැඳින්වේ.
12. ගල් ඔය හරස් කර ..... ජලාශය ඉදි කර ඇත.
13. ටිමෝර් මුහුදු අයත් වන්නේ ..... සාගරයට ය.
14. 2024 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ වැඩි ම ජන සංඛ්‍යාව ..... දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.
15. භූ ලක්ෂණ සිතියම්වල පූර්ණ ඊ හිසකින් ..... උතුර දක්වා ඇත.
16. විශේෂ ප්‍රාගුණ්‍යය, තාක්ෂණයේ දියුණුව හා ශ්‍රම විභජනය ..... කර්මාන්තයක මූලික පදනම වේ.

- අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන යොදා ගන්න.



මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන පොපාර්තමේන්තුව, 2026

17. සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය ඉහළ ම අගයක් වාර්තා වී ඇත්තේ ..... වර්ෂයේ දී ය.
18. මිලියන 5ත් 10ත් අතර ජන සංඛ්‍යාවක් වාර්තා වූ වර්ෂ ගණන කීය ද? .....
19. අඩු ම ජන සංඛ්‍යාවක් වාර්තා වූ වර්ෂය වන්නේ ..... ය.
20. ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකය ක්‍රමානුකූල ව පහළ බසින්නේ ..... වර්ෂයෙන් පසුව ය.

PAST PAPERS WIKI

- අංක **20** සිට **25** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරු අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති නිත් ඉර මත ලියා දක්වන්න.**

21.

'අ'	'ආ'
මහාද්වීපය	**සානුව**
1. දකුණු ඇමරිකා	A. බියේ
2. අප්‍රිකා	B. මොංගෝලියානු
3. ආසියා	C. මෙක්සිකෝ
	D. බ්‍රසීලියානු

(1) A, D, C (2) B, D, A (3) D, A, B (4) D, B, A (.....)

22.

'අ' දේශගුණික කලාපය	'ආ' දේශගුණ වර්ගය
1. සෞම්‍ය	A. තුන්ද්‍රා
2. නිවර්තන	B. මෝසම්
3. ශීත	C. ආක්ටික්
	D. මධ්‍යධරණී

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, A (.....)

23.

'අ' දිස්ත්‍රික්කය	'ආ' මැණික් හමුවන ප්‍රදේශය
1. මොනරාගල	A. පැල්මඩුල්ල
2. රත්නපුරය	B. ඔක්කම්පිටිය
3. මාතලේ	C. ඇළහැර
	D. බලංගොඩ

(1) A, D, B (2) B, A, C (3) B, D, A (4) C, D, B (.....)

24.

'අ' බලශක්ති උත්පාදකය	'ආ' බලාගාරය
1. සුළඟ	A. යුගදනවි
2. ජලය	B. ලක්විජය
3. ගල් අඟුරු	C. තම්බපවනි
	D. විමලසුරේන්ද්‍ර

(1) A, D, B (2) B, C, D (3) C, D, B (4) D, C, A (.....)

25.

'අ' වර්ගය	'ආ' පාෂාණය
1. ආග්නේය	A. ගැබ්රෝ
2. විපරීත	B. දියමන්ති
3. අවසාදිත	C. ජිප්සම්
	D. මිනිරන්

(1) A, B, C (2) A, D, B (3) B, D, C (4) C, B, A (.....)

- අංක **26** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

26. නිවර්තන වර්ෂා වනාන්තරයක දැකිය හැකි ලක්ෂණයකි.
(1). ඉහළ ජෛව විවිධත්වයකින් යුක්ත වීම (2). පැහැදිලි ස්තරායනයක් නොමැති වීම
(3). පතනශීලී ශාක බහුල වීම (4). මෘදු දැව සහිත ශාක නිබීම (.....)

27. තෙත් කලාපයට පමණක් ආවේණික පස් වර්ගයක් දැක්වෙන වරණය තෝරන්න.
(1). රතු කහ පොඩ්සෝල් (2). රතු කහ ලැටසෝල්
(3). රතු දුඹුරු ලැටසෝල් (4). රතු දුඹුරු පස (.....)

28. වර්තමානයේ ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදනයෙන් 95% ක් සපයනු ලබන්නේ,
(1). යුරෝපා රටවලිනි. (2). දකුණු හා අග්නිදිග ආසියාතික රටවලිනි.
(3). අප්‍රිකානු කලාපයේ රටවලිනි. (4). දකුණු ඇමරිකානු රටවලිනි. (.....)

29. ජපන් දූපත් පිහිටා ඇති භූ තැටිය මින් කුමක් ද?
(1). අප්‍රිකානු (2). ඉන්දු - ඕස්ට්‍රේලියානු
(3). පැසිෆික් (4). යුරේසියානු (.....)

30. ජලය ප්‍රයෝජනයට ගැනීමේ දී මතුවන ගැටලුවක් නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.
(1). ධීවර කටයුතු සඳහා භාවිත කිරීම (2). කෘෂි කටයුතු සඳහා යොදා ගැනීම
(3). නාස්තිය අවම වීම (4). ලවණීකරණයට ලක් වීම (.....)

31. ධමනි මිනිරන් භාවිතයෙන් සිදු කරන නිෂ්පාදන කර්මාන්තයක් දැක්වෙන වරණය තෝරන්න.
(1). ලිහිසි ද්‍රව්‍ය (2). ප්ලාස්ටික් නිෂ්පාදන
(3). බොයිලේරු ආවරණ (4). විද්‍යුත් පරිවාරක (.....)

32. පහත දැක්වෙන නිර්ණායක යොදා ගනු ලබන්නේ කුමන දර්ශකයක් මැනීම සඳහා ද?
- උපතේ දී ආයු අපේක්ෂාව
- සාක්ෂරතාව
- ක්‍රය ශක්තිය හා ගැළපූ ඒක පුද්ගල ආදායම

(1). මානුෂ සංතුෂ්ටි දර්ශකය (2). මානුෂ පීඩක දර්ශකය
(3). මානුෂ දරිද්‍රතා දර්ශකය (4). මානුෂ සංවර්ධන දර්ශකය (.....)

33. වර්ෂ 2000-2010 කාලයේ දී විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළින් ම සිටි නැගෙනහිර ආසියාතික රට මින් කුමක් ද?
(1). ජපානය (2). චීනය
(3). තායිවානය (4). දකුණු කොරියාව (.....)

34. දේශගුණ වෙනස් වීම් නිසා තීව්‍ර විය හැකි ස්වාභාවික උපද්‍රව යුගලයක් දැක්වෙන වරණය තෝරන්න.
(1). නායයෑම් හා භූමිකම්පා (2). වසංගත රෝග හා සුනාමි
(3). ගිනිකඳු පිපිරීම හා නියඟ (4). නියඟ හා වාසුළි (.....)

35. සුළු අපනයන බෝග වගා ව්‍යාප්තිය වැඩි ම දිස්ත්‍රික්කය කුමක් ද?
(1). ගම්පහ (2). පුත්තලම
(3). මාතලේ (4). මාතර (.....)

36. භූ ලක්ෂණ සිතියමක රතු පැහැති ත්‍රිකෝණයකින් නිරූපණය කරන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1). තානායම (2). හෝටලය
(3). සංචාරක බංගලාව (4). ත්‍රිකෝණමිතික ස්ථානය (.....)

37. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීමේ දී වැඩි දායකත්වයක් සපයන කාර්මික ක්ෂේත්‍රය වන්නේ,
(1). රෙදි පිළි හා ඇඟලුම් (2). පෙට්‍රෝලියම් නිෂ්පාදන
(3). මැණික් හා ස්වර්ණාභරණ (4). යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (.....)

- පහත **A, B, C** හා **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. දළ ජාතික ආදායම
2. විදේශ විනිමය

B - 1. සම්පත් සංරක්ෂණය
2. තිරසර සංවර්ධනය

C - 1. භූමි භායනය
2. කෘෂි අස්වැන්න

D - 1. අධ්‍යාපනය
2. ආයු අපේක්ෂාව

38. පළමුවැන්න වැඩි වන විට දෙවැන්න අඩුවන ප්‍රකාශ යුගලය මින් කුමක් ද?
(1). A (2). B (3). C (4). D (.....)

39. දෙවැන්නේ පැවැත්මට පළමුවැන්න හේතුවන මාතෘකා යුගලය කුමක් ද?
(1). A (2). B (3). C (4). D (.....)

40. පළමුවැන්නේ වැඩි වීමට දෙවැන්න හේතුවන මාතෘකා යුගලය මින් කුමක් ද?
(1). A (2). B (3). C (4). D (.....)

❋ ❋ ❋ ❋

Past Papers Wiki

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

61	S	I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - උපකාරක තක්සේරුව - 2026
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - பயிற்சி வினாத்தாள - 2026
General Certificate Examination (Ordinary Level) Examination – Supportive Assessment - 2026

භූගෝල විද්‍යාව - II

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **I** හා **II** වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* **I** කොටසේ **01** ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* **II** කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

I කොටස

01. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

- අංක (i) සිට (iv) තෙක් ප්‍රශ්නවලට පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. අංක ① න් දැක්වෙන ස්වාභාවික වෘක්ෂලතා වර්ගය කුමක් ද?
(කඩොලාන / වගුරු බිම / ලඳු කැළෑ) (ලකුණු 01 යි)

ii. අංක ② න් දැක්වෙන දුම්රිය මාර්ග වර්ගය කුමක් ද?
(පටු මාර්ගය / පුළුල් ඒකීය / පුළුල් ද්විතීය) (ලකුණු 01 යි)

iii. A - A ලක්ෂණයෙන් දැක්වෙනුයේ කුමක් ද?
(දළ බෑවුම / කොන් කන්ද / කපොල්ල) (ලකුණු 01 යි)

iv. අංක ③ න් දක්වා ඇති භූ විෂමතා ලක්ෂණය කුමක් ද?
(තැන් උස / ත්‍රිකෝණමිතික ස්ථානය / සානුව) (ලකුණු 01 යි)

v. පරිපාලන මායිම බෙදීම සඳහා භාවිත කර ඇති භෞතික ලක්ෂණය නම් කරන්න. (ලකුණු 01 යි)

vi. අංක ④ චතුරස්‍රය තුළ දක්නට ලැබෙන සංස්කෘතික ලක්ෂණ දෙකක් නම් කරන්න (ලකුණු 02 යි)

vii. අංක ⑤ ස්ථානයේ අක්ෂාංශ අගය ලියා දක්වන්න. (ලකුණු 01 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (viii) හා (ix) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් **'නි'** යන්න ද, වැරදි නම් **'වැ'** යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංක ඉදිරියෙන් ලියා දක්වන්න.

viii. X - Y මාර්ග කොටසේ දිග කිලෝ මීටර් 3 ක් පමණ වේ. (ලකුණු 01 යි)

ix. සිතියම් ප්‍රදේශයේ කෘෂි බෝග වගාවන් හයක් පමණ ඇත. (ලකුණු 01 යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම භාවිතයෙන් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

i. වැඩි විල - Ⓐ, Ⓑ, Ⓒ
ii. ඕබි ගඟ - Ⓓ, Ⓔ, Ⓕ
iii. තුර්කිය - Ⓖ, Ⓗ, Ⓘ
iv. බිස්කේ බොක්ක - Ⓛ, Ⓜ, Ⓝ
v. ශාන්ත හෙලේනා යමහල - Ⓟ, Ⓠ, Ⓡ (ලකුණු 05 යි)


(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම භාවිතයෙන් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

i. තලවකැලේ තේ පර්යේෂණ ආයතනය - Ⓐ, Ⓑ, Ⓒ
ii. සීගිරිය - Ⓓ, Ⓔ, Ⓕ
iii. සුළු පොල් ත්‍රිකෝණය - Ⓛ, Ⓜ, Ⓝ
iv. ආනවිලුන්දාව - Ⓟ, Ⓠ, Ⓡ
v. පුල්මුඩේ - Ⓧ, Ⓨ, Ⓩ (ලකුණු 05 යි)

II කොටස

02. (i). පෘථිවිය මතුපිට ජල ව්‍යාප්තිය දැක්වෙන මෙම සටහනෙහි ‘B’ හා ‘C’ නිවැරදි ව නම් කරන්න. (ලකුණු 02 යි)



(ii). මෙම සටහනෙහි ‘A’ මූලාශ්‍රය ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii). ජලයේ ගුණාත්මක බව අඩු වීම නිසා ඇතිවිය හැකි බලපෑම් **තුනක්** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

03. (i). පෙට්‍රෝ-රසායන කර්මාන්ත මගින් නිපදවන කෘෂිකර්මාන්තයට අවශ්‍ය නිෂ්පාදන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). පෙට්‍රෝ-රසායන කර්මාන්තය තුළ දැකිය හැකි ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii). බොර තෙල් මිල උච්චාවචනය ශ්‍රී ලංකාවේ පෙට්‍රෝ-රසායන කර්මාන්තය කෙරෙහි බලපාන ආකාර **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

04. (i). ශ්‍රී ලංකාවේ දැඩි ස්වාභාවික රක්ෂිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). (a). ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපවල දක්නට ලැබෙන වනාන්තර වර්ගය නම් කරන්න.

(b). එම වනාන්තර වල කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ වන ජීවී සංරක්ෂණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** දක්වා, ඒවා ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

05. (i). පහත දැක්වෙන හස්ත කර්මාන්ත දක්නට ලැබෙන ප්‍රධාන ප්‍රදේශය බැගින් නම් කරන්න.

(a). වේවැල් භාණ්ඩ

(b). බීරලු රේන්ද (ලකුණු 02 යි)

(ii). ගෘහ කර්මාන්ත ආශ්‍රිත කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා හස්ත කර්මාන්ත දායක වන ආකාර **තුනක්** උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

06. (i). ශ්‍රී ලංකාවේ රබර් වගා කරනු ලබන සාම්ප්‍රදායික දිස්ත්‍රික්ක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). ශ්‍රී ලංකාවේ රබර් වගාවේ ව්‍යාප්තිය කෙරෙහි බලපා ඇති මානුෂ සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ රබර් වගාව මුහුණ දෙන ගැටලු **තුනක්** නම් කර, ඒවාට ගත හැකි විසඳුම් **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 05 යි)

07. (i). ස්වාභාවික නොවන ආපදා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). නායයෑමක් හඳුනා ගත හැකි පූර්ව ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii). නායයෑම් ආපදාව අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

08. (i). (a). දකුණු ඇමරිකා මහාද්වීපයේ ජන සංඛ්‍යාව වැඩි ම රට,

(b). අප්‍රිකා මහාද්වීපයේ ජන සංඛ්‍යාව වැඩි ම රට,

නම් කරන්න. (ලකුණු 02 යි)

(ii). ලෝකයේ ජන සංකේන්ද්‍රණ ප්‍රදේශ ආශ්‍රිත ව හඳුනා ගත හැකි පොදු ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධන වේගයේ කාලික පහළ බැසීම නිසා ඇතිවිය හැකි අහිතකර බලපෑම් **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

❋❋❋❋

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education & Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026
General Certificate of Education (Ordinary Level) Examination - 2026

භූගෝල විද්‍යාව	**I, II**
புவியியல்	**I, II**
Geography	**I, II**

විභාග අංකය:.....

1· (ඇ) / (அ) / (a)

i. ----------

ii. ----------

iii. ----------

iv. ----------

v. ----------

vi. ----------

---


vii. ----------

viii. ----------

ix. ----------

10

(ஆ) / (ஆ) / (b)



N

(i) ☐

(ii) ☐


(iii) ☐

(iv) ☐

(v) ☐

5

(இ) / (இ) / (c)



N

(i) ☐

(ii) ☐

(iii) ☐

(iv) ☐


(v) ☐

5

1. (அ) (அ) (a) $\frac{}{10}$ (ஆ) (அ) (b) $\frac{}{5}$ (இ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம்
Ministry of Education, Higher Education & Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - 2026
General Certificate of Education (Ordinary Level) Examination - 2026



1:50,000

Past Papers Wiki

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026

கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை – 2026

General Certificate of Education (Ordinary Level) Examination - 2026

උපකාරක තක්සේරුව	- පිළිතුරු පත්‍රය
உதவி மதிப்பீடு	- விடைப்பத்திரம்
Supportive Assessment	- Answer Sheet

සිංහල මාධ්‍යය
சிங்கள மொழி மூலம்
Sinhala Medium

භූගෝල විද්‍යාව

Geography

புவியியல்



පිළිතුරු පත්‍රය - விடைப்பத்திரம் - Answer Sheet

PAST PAPERS WIKI

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
தேசிய மொழிகள் மற்றும் சமூக விஞ்ஞான கிளை
Ministry of Education, Higher Education and Vocational Education
National Languages and Humanities Branch

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

61 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - උපකාරක තක්සේරුව - 2026
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - பயிற்சி வினாத்தாள - 2026
General Certificate Examination (Ordinary Level) Examination – Supportive Assessment - 2026

භූගෝල විද්‍යාව	I, II
புவியியல்	I, II
Geography	I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය	- මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம்	- 10 நிமிடங்கள்
Additional Reading Time	- 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

භූගෝල විද්‍යාව - I

උපදෙස්:

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු** ම ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ** ම පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **කිත් ඉර මත ලියන්න.**

1. උන්නතාංශය සමග .....**උෂ්ණත්වය**..... වෙනස් වීමේ ස්වභාවය පදනම් කර ගෙන වායුගෝලය ස්තරවලට බෙදා ඇත.
(පීඩනය / උෂ්ණත්වය / ඝනත්වය)

2. යපස්, ගල් අඟුරු හා .....**හුණුගල්**..... නිධි බහුල රටවල මුල් කාලයේ දී යකඩ හා වානේ කර්මාන්තය ස්ථාන ගත විය.
(හුණුගල් / මිනිරන් / බනිජ වැලි)

3. ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් වැඩි වශයෙන් භාවිත කරනු ලබන්නේ .....**ප්‍රවාහන**..... කටයුතු සඳහා ය.
(ගෘහස්ත / කාර්මික හා වාණිජ / ප්‍රවාහන)

4. .....**ඉන්දුනීසියාව**..... ළැව්ගිනි බහුල ව හට ගන්නා අග්නිදිග ආසියාතික රටකි.
(ඉන්දුනීසියාව / ඕස්ට්‍රේලියාව / චීනය)

5. කඳුකර තෙත් කලාපීය වනාන්තර .....**1200m**..... ට වැඩි උස් බිම්වල දක්නට ලැබේ.
(800m / 1200m / 1400m)


- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **'නි'** යන්න වටා ද, වැරදි නම් **'වැ'** යන්න වටා ද රවුමක් අඳින්න.

6. පහළ ප්‍රාවරණය හා පිටත හරය වෙන් කරන සීමාව ගුටෙන්බර්ග් අසන්තතිය යි. (නි) / වැ
7. මුළුමනින් ම ජීර්ණය වූ මව් පාෂාණ කොටස් හා එන්ද්‍රීය ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් B මහලෙහි දක්නට ලැබේ. නි / (වැ)
8. ලෝකයේ මිරිදිය පිරුණු විශාලතම විල ටිටිකාකා විල යි. නි / (වැ)
9. ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උද්‍යානය ගන්නොරුවේ පිහිටා ඇත. (නි) / වැ
10. පෘථිවිය දෙසට පැමිණෙන උල්කාෂ්ම මෙසෝගෝලයේ දී දැවී යයි. නි / (වැ)

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. පිලිපීන දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිෆික් සාගරයේ ඇතිවන සුළි සුළං .....බැගියෝ/බැගියොස්..... ලෙස හැඳින්වේ.
12. ගල් ඔය හරස් කර .....ඉඹිනියාගල..... ජලාශය ඉදි කර ඇත.
13. ටිමෝර් මුහුදු අයත් වන්නේ .....ඉන්දියන්..... සාගරයට ය.
14. 2024 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ වැඩි ම ජන සංඛ්‍යාව .....ගම්පහ..... දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.
15. භූ ලක්ෂණ සිතියම්වල පූර්ණ ඊ හිසකින් .....ජාල..... උතුර දක්වා ඇත.
16. විශේෂ ප්‍රාගුණ්‍යය, තාක්ෂණයේ දියුණුව හා ශ්‍රම විභජනය .....එකලස් කිරීමේ..... කර්මාන්තයක මූලික පදනම වේ.

- අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන යොදා ගන්න.



මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන පොපාර්තමේන්තුව, 2026

17. සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය ඉහළ ම අගයක් වාර්තා වී ඇත්තේ .....1953..... වර්ෂයේ දී ය.
18. මිලියන 5ත් 10ත් අතර ජන සංඛ්‍යාවක් වාර්තා වූ වර්ෂ ගණන කීය ද? .....කුනු යි / 03.....
19. අඩු ම ජන සංඛ්‍යාවක් වාර්තා වූ වර්ෂය වන්නේ .....1871..... ය.
20. ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකය ක්‍රමානුකූල ව පහළ බසින්නේ .....1953..... වර්ෂයෙන් පසුව ය.

- අංක **20** සිට **25** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරු අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති කිත් ඉර මත ලියා දක්වන්න.**

21.

'අ'	'ආ'
මහාද්වීපය	**සානුව**
1. දකුණු ඇමරිකා	A. බියේ
2. අප්‍රිකා	B. මොංගෝලියානු
3. ආසියා	C. මෙක්සිකෝ
	D. බ්‍රසීලියානු

(1) A, D, C (2) B, D, A (3) D, A, B (4) D, B, A (.....3.....)

22.

'අ' දේශගුණික කලාපය	'ආ' දේශගුණ වර්ගය
1. සෞම්‍ය	A. තුන්ද්‍රා
2. නිවර්තන	B. මෝසම්
3. ශීත	C. ආක්ටික්
	D. මධ්‍යධරණී

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, A (..4..)

23.

'අ' දිස්ත්‍රික්කය	'ආ' මැණික් හමුවන ප්‍රදේශය
1. මොනරාගල	A. පැල්මඩුල්ල
2. රත්නපුරය	B. ඔක්කම්පිටිය
3. මාතලේ	C. ඇළහැර
	D. බලංගොඩ

(1) A, D, B (2) B, A, C (3) B, D, A (4) C, D, B (..2..)

24.

'අ' බලශක්ති උත්පාදකය	'ආ' බලාගාරය
1. සුළඟ	A. යුගදනවි
2. ජලය	B. ලක්විජය
3. ගල් අඟුරු	C. තම්බපවනි
	D. විමලසුරේන්ද්‍ර

(1) A, D, B (2) B, C, D (3) C, D, B (4) D, C, A (..3..)

25.

'අ' වර්ගය	'ආ' පාෂාණය
1. ආග්නේය	A. ගැබ්රෝ
2. විපරීත	B. දියමන්ති
3. අවසාදිත	C. ජිප්සම්
	D. මිනිරන්

(1) A, B, C (2) A, D, B (3) B, D, C (4) C, B, A (..1..)

- අංක **26** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

26. නිවර්තන වර්ෂා වනාන්තරයක දැකිය හැකි ලක්ෂණයකි.
(1). ඉහළ ජෛව විවිධත්වයකින් යුක්ත වීම (2). පැහැදිලි ස්තරායනයක් නොමැති වීම
(3). පතනශීලී ශාක බහුල වීම (4). මෘදු දැව සහිත ශාක තිබීම (..1..)

27. තෙත් කලාපයට පමණක් ආවේණික පස් වර්ගයක් දැක්වෙන වරණය තෝරන්න.
(1). රතු කහ පොඩ්සෝල් (2). රතු කහ ලැටසෝල්ස්
(3). රතු දුඹුරු ලැටසෝල් (4). රතු දුඹුරු පස (..3..)

28. වර්තමානයේ ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදනයෙන් 95% ක් සපයනු ලබන්නේ,
(1). යුරෝපා රටවලිනි. (2). දකුණු හා අග්නිදිග ආසියාතික රටවලිනි.
(3). අප්‍රිකානු කලාපයේ රටවලිනි. (4). දකුණු ඇමරිකානු රටවලිනි. (..2..)

29. ජපන් දූපත් පිහිටා ඇති භූ තැටිය කුමක් ද?
(1). අප්‍රිකානු (2). ඉන්දු - ඕස්ට්‍රේලියානු
(3). පැසිෆික් (4). යුරේසියානු (..4..)

30. ජලය ප්‍රයෝජනයට ගැනීමේ දී මතුවන ගැටලුවක් නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.
(1). ධීවර කටයුතු සඳහා භාවිත කිරීම (2). කෘෂි කටයුතු සඳහා යොදා ගැනීම
(3). නාස්තිය අවම වීම (4). ලවණීකරණයට ලක් වීම (...4...)

31. ධමනි මිනිරන් භාවිතයෙන් සිදු කරන නිෂ්පාදන කර්මාන්තයක් දැක්වෙන වරණය තෝරන්න.
(1). ලිහිසි ද්‍රව්‍ය (2). ප්ලාස්ටික් නිෂ්පාදන
(3). බොයිලේරු ආවරණ (4). විද්‍යුත් පරිවාරක (...1...)

32. පහත දැක්වෙන නිර්ණායක යොදා ගනු ලබන්නේ කුමන දර්ශකයක් මැනීම සඳහා ද?
- උපතේ දී ආයු අපේක්ෂාව
- සාක්ෂරතාව
- ක්‍රය ශක්තිය හා ගැලපූ ඒක පුද්ගල ආදායම

(1). මානුෂ සංතුෂ්ටි දර්ශකය (2). මානුෂ පීඩක දර්ශකය
(3). මානුෂ දරිද්‍රතා දර්ශකය (4). මානුෂ සංවර්ධන දර්ශකය (...4...)

33. වර්ෂ 2000-2010 කාලයේ දී විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළින් ම සිටි නැගෙනහිර ආසියාතික රට මින් කුමක් ද?
(1). ජපානය (2). චීනය
(3). තායිවානය (4). දකුණු කොරියාව (...2...)

34. දේශගුණ වෙනස් වීම් නිසා තීව්‍ර විය හැකි ස්වාභාවික උපද්‍රව යුගලයක් දැක්වෙන වරණය තෝරන්න.
(1). නායයෑම් හා භූමිකම්පා (2). වසංගත රෝග හා සුනාමි
(3). ගිනිකඳු පිපිරීම හා නියඟ (4). නියඟ හා වාසුළි (...4...)

35. සුළු අපනයන බෝග වගා ව්‍යාප්තිය වැඩි ම දිස්ත්‍රික්කය කුමක් ද?
(1). ගම්පහ (2). පුත්තලම
(3). මාතලේ (4). මාතර (...3...)

36. භූ ලක්ෂණ සිතියමක රතු පැහැති ත්‍රිකෝණයකින් නිරූපණය කරන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1). තානායම (2). හෝටලය
(3). සංචාරක බංගලාව (4). ත්‍රිකෝණමිතික ස්ථානය (...2...)

37. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීමේ දී වැඩි දායකත්වයක් සපයන කාර්මික ක්ෂේත්‍රය වන්නේ,
(1). රෙදි පිළි හා ඇඟලුම් (2). පෙට්‍රෝලියම් නිෂ්පාදන
(3). මැණික් හා ස්වර්ණාභරණ (4). යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (...1...)

- පහත **A, B, C** හා **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. දළ ජාතික ආදායම
2. විදේශ විනිමය

B - 1. සම්පත් සංරක්ෂණය
2. තිරසර සංවර්ධනය

C - 1. භූමි හායනය
2. කෘෂි අස්වැන්න

D - 1. අධ්‍යාපනය
2. ආයු අපේක්ෂාව

38. පළමුවැන්න වැඩිවන විට දෙවැන්න අඩුවන ප්‍රකාශ යුගලය මින් කුමක් ද?
(1). A (2). B (3). C (4). D (...3/C...)

39. දෙවැන්නේ පැවැත්මට පළමුවැන්න හේතුවන මාතෘකා යුගලය කුමක් ද?
(1). A (2). B (3). C (4). D (...2/B...)

40. පළමුවැන්නේ වැඩි වීමට දෙවැන්න හේතුවන මාතෘකා යුගලය මින් කුමක් ද?
(1). A (2). B (3). C (4). D (...1/A...)

PAST PAPERS WIKI

❋ ❋ ❋ ❋

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

61	S	I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - උපකාරක තක්සේරුව - 2026
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - பயிற்சி வினாத்தாள - 2026
General Certificate Examination (Ordinary Level) Examination – Supportive Assessment - 2026

භූගෝල විද්‍යාව - II

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **I** හා **II** වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* **I** කොටසේ **01** ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට** ම පිළිතුරු සැපයිය යුතු ය.
* **II** කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

I කොටස

01. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

- අංක (i) සිට (iv) තෙක් ප්‍රශ්නවලට පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. අංක ① න් දැක්වෙන ස්වාභාවික වෘක්ෂලතා වර්ගය කුමක් ද?
(කඩොලාන / වගුරු බිම / ලඳු කැළෑ) (ලකුණු 01 යි)

ii. අංක ② න් දැක්වෙන දුම්රිය මාර්ග වර්ගය කුමක් ද?
(පටු මාර්ගය / පුළුල් ඒකීය / පුළුල් ද්විතීය) (ලකුණු 01 යි)

iii. A - A ලක්ෂණයෙන් දැක්වෙනුයේ කුමක් ද?
(දල බෑවුම / කොත් කන්ද / කපොල්ල) (ලකුණු 01 යි)

iv. අංක ③ න් දක්වා ඇති භූ විෂමතා ලක්ෂණය කුමක් ද?
(තැන් උස / ත්‍රිකෝණමිතික ස්ථානය / සානුව) (ලකුණු 01 යි)

v. පරිපාලන මායිම බෙදීම සඳහා භාවිත කර ඇති භෞතික ලක්ෂණය නම් කරන්න. (ලකුණු 01 යි)

vi. අංක ④ චතුරස්‍රය තුළ දක්නට ලැබෙන සංස්කෘතික ලක්ෂණ **දෙකක්** නම් කරන්න (ලකුණු 02 යි)

vii. අංක ⑤ ස්ථානයේ අක්ෂාංශ අගය ලියා දක්වන්න. (ලකුණු 01 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (viii) හා (ix) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් **'නි'** යන්න ද, වැරදි නම් **'වැ'** යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංක ඉදිරියෙන් ලියා දක්වන්න.

viii. X-Y මාර්ග කොටසේ දිග කිලෝ මීටර් 3 ක් පමණ වේ. (ලකුණු 01 යි)

ix. සිතියම් ප්‍රදේශයේ කෘෂි බෝග වගාවන් හයක් පමණ ඇත. (ලකුණු 01 යි)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - උපකාරක තක්සේරුව - **2026**
கல்விப் பொது தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - பயிற்சி வினாத்தாள - 2026
General Certificate Examination (Ordinary Level) Examination – Supportive Assessment - 2026

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

විභාග අංකය:.....

1· (ඇ) / (அ) / (a)

i. වගුරු බිම ---------- 1

ii. පුළුල් ඒකීය ---------- 1

iii. කපොල්ල ---------- 1

iv. තැන් උස ---------- 1

v. ගංගාව / ගඟ ---------- 1

vi. පාසල / බෞද්ධ සිද්ධස්ථානය / අප්‍රධාන මාර්ගය / ගෙවතු / 1

ජීප් රථ මාර්ගය / අඩිපාර / පොල් වගාව / වී වගාව (මින් දෙකක්) ----------

vii. උතුරු අක්ෂාංශ 6^0 55’ ---------- 1

viii. වැ ---------- 1

ix. වැ ---------- 1

10/10

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.


i. වැඩි විල - Ⓐ, Ⓑ, Ⓒ
ii. ඕබි ගඟ - Ⓓ, Ⓔ, Ⓕ
iii. තුර්කිය - Ⓖ, Ⓗ, Ⓘ
iv. බිස්කේ බොක්ක - Ⓛ, Ⓜ, Ⓝ
v. ශාන්ත හෙලේනා යමහල - Ⓟ, Ⓠ, Ⓡ (ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.


i. තලවකැලේ තේ පර්යේෂණ ආයතනය - Ⓐ, Ⓑ, Ⓒ
ii. සීගිරිය - Ⓓ, Ⓔ, Ⓕ
iii. සුළු පොල් ත්‍රිකෝණය - Ⓛ, Ⓜ, Ⓝ
iv. ආනවිලුන්දාව - Ⓟ, Ⓠ, Ⓡ
v. පුල්මුඩේ - Ⓧ, Ⓨ, Ⓩ (ලකුණු 05 යි)

(ආ) / (ஆ) / (b)



(i)	A
(ii)	F
(iii)	H
(iv)	N
(v)	Q
	5/5

(ඉ) / (இ) / (c)




(i)	C
(ii)	F
(iii)	M
(iv)	Q
(v)	X
	5/5

1. (අ) (அ) (a) $\frac{10}{10}$ (ආ) (ஆ) (b) $\frac{5}{5}$ (ඉ) (இ) (c) $\frac{5}{5}$ $= \frac{20}{20}$

II කොටස

02. (i). පෘථිවිය මතුපිට ජල ව්‍යාප්තිය දැක්වෙන මෙම සටහනෙහි 'B' හා 'C' නිවැරදි ව නම් කරන්න.

- B - පාංශු ජලය
- C - ගංගා ජලය



(මූලාශ්‍ර දෙක නිවැරදි ව නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)

(ii). මෙම සටහනෙහි 'A' මූලාශ්‍රය ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් තුනක් දක්වන්න.

(විල් ආශ්‍රිත ක්‍රියාකාරකම් දක්වා තිබිය යුතුයි)

- සීවර කර්මාන්තය – මසුන් හා අනෙකුත් ජලජ සම්පත් ලබා ගැනීම...
- කෘෂිකර්මාන්තය – විල් ජලය වාරිමාර්ග සඳහා භාවිත කිරීම
- පානීය හා ගෘහස්ථ ජල සැපයුම – ජනතාවට අවශ්‍ය ජලය ලබා ගැනීම
- කර්මාන්ත සඳහා ජලය භාවිත කිරීම – නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ජලය ලබා ගැනීම
- සංචාරක කර්මාන්තය – බෝට්ටු සවාරි, විවේක ගමන්, දර්ශන නැරඹීම...
- විනෝදාත්මක ක්‍රියාකාරකම් – පිහිනීම, ඔරු පැදීම, මසුන් ඇල්ලීම...
- ජල ජීවී වගාව – මත්ස්‍ය හා ඉස්සන් වගාව...
- ප්‍රවාහන කටයුතු –බෝට්ටු හා නැව් මගින් මිනිසුන් හා භාණ්ඩ ප්‍රවාහනය
- ජල විදුලිය නිෂ්පාදනය

(යනාදි විල් ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් තුනක් නිවැරදි ව දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)

(iii). ජලයේ ගුණාත්මක බව අඩු වීම නිසා ඇතිවිය හැකි බලපෑම් තුනක් නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

- පිරිසිදු පානීය ජල හිඟ වීම
- අපිරිසිදු ජලය නිසා විවිධ ලෙඩ රෝග වැළඳීම (පාචනය, කොලරාව, අතීසාරය වැනි)
- ජලජ ජීවීන්ට හානි සිදු වීම
- ජල පිරිපහදුවට අධික වියදම් දැරීමට සිදු වීම
- වගා කටයුතු අඩාල වීම
- පිරිසිදු ජලය සඳහා තරගයක්/අර්බුද ඇතිවීම
- පරිසර පද්ධති වෙනස්/විනාශ වීම

(යනාදි බලපෑම් තුනක් නිවැරදිව නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03
ඉන් එකක් කෙටියෙන් විස්තර කිරීමට ලකුණු 02
ලකුණු 05 යි)

03. (i). පෙට්‍රෝ-රසායන කර්මාන්ත මගින් නිපදවන කෘෂිකර්මාන්තයට අවශ්‍ය නිෂ්පාදන දෙකක් නම් කරන්න.

- කෘමිනාශක
- වල් නාශක
- දිලීර නාශක
- රසායනික පොහොර
- ප්ලාස්ටික් උපාංග හා උපකරණ (බට, බීජ තැටි, තවාන් බඳුන්, බීජ ඇසුරුම් ආදිය)

(යනාදි නිෂ්පාදන දෙකක් නිවැරදිව නම් කිරීමට - ලකුණු 02 යි)

(ii). පෙට්‍රෝ-රසායන කර්මාන්තය තුළ දැකිය හැකි ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

- අමුද්‍රව්‍ය සපයා ගැනීම බොර තෙල් හා ස්වාභාවික වායු මත රඳා පැවතීම
- නව තාක්ෂණික ක්‍රම හා ශිල්ප ක්‍රම භාවිතය
- ප්‍රාග්ධන සූක්ෂ්ම කර්මාන්තයක් වීම
- ඉහළ තාක්ෂණය හා සංකීර්ණ නිෂ්පාදන ක්‍රියාවලි
- දක්ෂ හා විශේෂඥ ශ්‍රමය
- මහා පරිමාණයෙන් නිෂ්පාදනය සිදු කිරීම
- අනෙකුත් කර්මාන්තවලට අමුද්‍රව්‍ය සපයන මූලික කර්මාන්තයක් වීම
- පරිසර දූෂණය ඇතිවිය හැකි බැවින් දැඩි පාරිසරික පාලන ක්‍රම භාවිත කිරීම

(යනාදි ලක්ෂණ තුනක් නිවැරදිව සඳහන් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)

(iii). බොර තෙල් මිල උච්චාවචනය ශ්‍රී ලංකාවේ පෙට්‍රෝ-රසායන කර්මාන්තය කෙරෙහි බලපාන ආකාර තුනක් පැහැදිලි කරන්න.

- නිෂ්පාදන වියදම් ඉහළ යාම නිසා භාණ්ඩ මිල ඉහළ යාම
- ඉහළ විදේශ විනිමයක් බොර තෙල් ආනයනය සඳහා වැය වීම
- විදේශ විනිමය ගැටලු නිසා බොර තෙල් ආනයන සීමා වීමෙන් අමුද්‍රව්‍ය සැපයීම අඩාල වීම
- කෘෂිකර්මාන්තයට සහ අනෙකුත් කර්මාන්තවලට වක්‍ර බලපෑම් ඇති වීම
- නිෂ්පාදන ප්‍රමාණය අඩු වීම

(යනාදි බලපෑම් තුනක් නිවැරදිව දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03
එම සඳහන් කරුණු දෙකක්වත් කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02
ලකුණු 05 යි)

04. (i). ශ්‍රී ලංකාවේ දැඩි ස්වාභාවික රක්ෂිත දෙකක් නම් කරන්න.

- හග්ගල
- රිටිගල
- යාල

(මින් දෙකක් නම් කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)

(ii). (a). ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපවල දක්නට ලැබෙන වනාන්තර වර්ගය නම් කරන්න.

- කටු පඳුරු හා ලඳු කැළෑ

(b). එම වනාන්තර වල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් නම් කරන්න.

- ශ්‍රී ලංකාවේ ගිනිකොන හා වයඹ දිග ප්‍රදේශවල ව්‍යාප්ත ව තිබීම
- උෂ්ණත්වය 27^0 C ට වැඩි නිසා නියඟයට ඔරොත්තු දෙන ශාක බහුල වීම
- කටු සහිත ශාකවල පත්‍ර උල්වන අතර, පත්‍ර ඝන ස්වභාවයෙන් පැවතීම
- වියළි කාලයේ දී බොහෝ ශාකවල පත්‍ර හැලී යාම
- වියළි දේශගුණයට හොඳින් අනුවර්තනය වූ ශාක
- පතොක්, කෝමාරිකා, පලු, වීර, එරමිණියා, කරඹ, සූරිය වැනි ගස් වර්ග දක්නට ලැබීම

(වනාන්තර වර්ගය නිවැරදිව නම් කිරීමට ලකුණු 01
එම වනාන්තර වල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් නිවැරදිව සඳහන් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 02
ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ වන ජීවී සංරක්ෂණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් දක්වා, ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු දෙකක් පැහැදිලි කරන්න.

- **වනජීවී සංරක්ෂණ ක්‍රියාමාර්ගය**
  - වනජීවී රක්ෂිත හා ජාතික උද්‍යාන පිහිටුවීම
  - වනජීවී හා වෘක්ෂලතා ආරක්ෂණ නීති ක්‍රියාත්මක කිරීම
  - තර්ජනයට ලක් වූ ශාක හා සත්ත්ව විශේෂ සංරක්ෂණය
  - සත්ත්ව අභයභූමි හා සංරක්ෂිත ප්‍රදේශ පවත්වා ගෙන යාම
  - ජනතාව දැනුම්වත් කිරීම
  - විදේශීය හා දේශීය ආයතන සමඟ එක්ව සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
  - මිනිස්-වනජීවී ගැටුම් අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- **ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු**
  - රක්ෂිත ප්‍රදේශ නැවත ආක්‍රමණය කිරීම
  - සංවර්ධන කටයුතු නිසා වන සතුන්ගේ වාසස්ථාන විනාශ වීම
  - රක්ෂිත සීමා ආරක්ෂා කිරීමේ අපහසුතා
  - නීති විරෝධී දඩයම් හා ජාවාරම් පාලනයේ අපහසුතා
  - නීති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් නිලධාරීන් හා පහසුකම් නොමැති වීම
  - වාසස්ථාන අහිමි වීම
  - ආහාර සම්පත් අඩු වීම
  - ජාන විවිධත්වය අඩු වීම
  - ප්‍රමාණවත් මූල්‍ය හා මානව සම්පත් හිඟය / විශාල ප්‍රදේශ නිරීක්ෂණය කිරීමේ අපහසුතා
  - නීති විරෝධී ක්‍රියාකාරකම්
  - ජනතාවගේ සහභාගීත්වය අඩු වීම / සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවීම
  - අරමුදල් අඛණ්ඩව ලබා ගැනීමේ අපහසුතා
  - ආයතන අතර සම්බන්ධීකරණ ගැටලු
  - අලි–මිනිස් ගැටුම් අඛණ්ඩව පැවතීම
  - ජනාවාස හා වගා බිම් වනජීවී වාසස්ථාන ආසන්නයට ව්‍යාප්ත වීම
  - වන්දි හා ආරක්ෂණ ක්‍රම පිළිබඳ ගැටලු

(යනාදි ක්‍රියාමාර්ග තුනක් නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03
ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු දෙකක් පැහැදිලි කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 02
ලකුණු 05 යි)

Past Papers Wiki

05. (i). පහත දැක්වෙන හස්ත කර්මාන්ත දක්නට ලැබෙන ප්‍රධාන ප්‍රදේශය බැගින් නම් කරන්න.

(a). වේවැල් භාණ්ඩ - රදාවඩුන්න / වේවැල් දෙණිය
(b). බීරලු රේන්ද - ගාල්ල, මාතර, කොග්ගල, වැලිගම වැනි දකුණු පළාත තුළ

(ප්‍රදේශ දෙකක් නිවැරදිව නම් කිරීමට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)

(ii). ගෘහ කර්මාන්ත ආශ්‍රිත කැපී පෙනෙන ලක්ෂණ තුනක් නම් කරන්න.

- බොහෝ විට පවුලේ ශ්‍රමය මත රඳා පැවතීම
- සාම්ප්‍රදායික දැනුම භාවිතය
- නිවස තුළ හෝ ඒ ආසන්නය පවත්වා ගෙන යාම
- කුඩා පරිමාණයේ කර්මාන්ත වීම
- කුඩා අත් යන්ත්‍ර හා සරල විදුලි උපකරණ භාවිතය
- මෙම නිෂ්පාදන ඇසුරින් සංස්කෘතික උරුමයන් ආරක්ෂා වී තිබීම
- සුළු ආයෝජනයක් සහිත වීම
- පිරිවැය අවම වීම
- අමුද්‍රව්‍ය ආශ්‍රිත ව නිෂ්පාදන ස්ථාන ගත වීම

(යනාදි ලක්ෂණ තුනක් නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා හස්ත කර්මාන්ත දායක වන ආකාර තුනක් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

- රැකියා අවස්ථා ඇති කිරීම
  (උදා: බතික් කර්මාන්තය, වේවැල් හා පන් කර්මාන්තය)
- දේශීය ආදායම් වැඩි කිරීම
  (උදා: මැටි භාණ්ඩ, දැව කැටයම්, රන් හා රිදී ආභරණ නිෂ්පාදනය)
- විදේශ විනිමය උපයා ගැනීම
  (උදා: බතික් නිෂ්පාදන, අත් යන්ත්‍ර රෙදි, පොල් ආශ්‍රිත නිෂ්පාදන)
- ග්‍රාමීය ආර්ථික සංවර්ධනය
  (උදා: කුරුණෑගල හා ගාල්ල ප්‍රදේශවල පන් හා වේවැල් කර්මාන්ත)
- සංචාරක කර්මාන්තය දියුණු කිරීම
  (උදා: වෙස් මුහුණු, දැව කැටයම්, මැටි පිළිම)
- දේශීය සම්පත් ප්‍රයෝජනයට ගැනීම
  (උදා: පොල් කටු භාණ්ඩ, මැටි භාණ්ඩ, බට හා වේවැල් නිෂ්පාදන)
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය
  (උදා: ගෘහස්ත බතික් නිෂ්පාදන ඒකක, අත්කම් භාණ්ඩ අලෙවි මධ්‍යස්ථාන)

(ආර්ථික සංවර්ධනය සඳහා හස්ත කර්මාන්ත දායක වන ආකාර තුනක් සඳහන් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03
උදාහරණ දෙකක්වත් සඳහන් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 02
ලකුණු 05 යි)

PAST PAPERS WIKI

06. (i). ශ්‍රී ලංකාවේ රබර් වගා කරනු ලබන සාම්ප්‍රදායික දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.

- කළුතර
- කෑගල්ල
- රත්නපුර

(මින් දෙකක් නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)

(ii). ශ්‍රී ලංකාවේ රබර් වගාවේ ව්‍යාප්තිය කෙරෙහි බලපා ඇති මානුෂ සාධක තුනක් සඳහන් කරන්න.

- පුහුණු ශ්‍රමය (දේශීය/විදේශීය)
- ප්‍රවාහන හා යටිතල පහසුකම්
- ජාත්‍යන්තර වෙළඳපොළ
- දේශීය වෙළඳපොළ
- රජයේ ප්‍රතිපත්ති හා සහනාධාර (සහනාධාර, පුහුණු වැඩසටහන් හා පර්යේෂණ සේවා ආදිය)
- රබර් සැකසුම් කර්මාන්තයේ වර්ධනය
- ජනාවාස වර්ධනය

(යනාදි මානුෂ සාධක තුනක් සඳහන් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ රබර් වගාව මුහුණ දෙන ගැටලු තුනක් නම් කර, ඒවාට ගත හැකි විසඳුම් දෙකක් යෝජනා කරන්න.

ගැටලු	විසඳුම්
- ස්වාභාවික රබර් සඳහා ඇති ලෝක වෙළඳපොළේ මිල උච්චාවචනය	- රබර් නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම - අගය එකතු කළ රබර් නිෂ්පාදන (ටයර්, අත් වැසුම්, කාර්මික භාණ්ඩ ආදිය) වැඩි කිරීම
- කෘත්‍රිම රබර් සමඟ ඇති තරගය	- උසස් තත්ත්වයේ ස්වාභාවික රබර් නිෂ්පාදනය කිරීම - නව වෙළඳපොළ සොයා ගැනීම
- රබර් වගා ඉඩම් වෙනත් භාවිතයන් සඳහා යොදා ගැනීම	- රබර් වගා ඉඩම් සංරක්ෂණය කිරීම - සුදුසු ඉඩම්වල නැවත වගා කිරීම ප්‍රවර්ධනය කිරීම
- ශ්‍රම හිඟය	- රබර් කිරි ලබාගැනීමේ ක්‍රියාවලිය යාන්ත්‍රීකරණය කිරීම - කම්කරුවන්ට වඩා හොඳ පහසුකම් හා දිරිගැන්වීම් ලබා දීම
- රෝග හා පළිබෝධ හානි	- රෝග ප්‍රතිරෝධී රබර් ප්‍රභේද වගා කිරීම - නිසි කෘෂි තාක්ෂණික ක්‍රම භාවිත කිරීම - රබර් පර්යේෂණ ආයතනය මගින් මෙම ක්‍රම හඳුන්වා දීම
- පැරණි රබර් ගස් හා අඩු ඵලදායිතාව	- පැරණි ගස් වෙනුවට නව උසස් ප්‍රභේද සිටුවීම - නවීන වගා ක්‍රම භාවිත කිරීම
- නිෂ්පාදන පිරිවැය ඉහළ යාම	- කාර්යක්ෂම වගා කළමනාකරණ ක්‍රම යොදා ගැනීම - නිෂ්පාදන වියදම් අඩු කිරීමේ ක්‍රම භාවිත කිරීම
- දේශගුණික වෙනස්කම් හා අයහපත් කාලගුණය	- සුදුසු වෙනත් ප්‍රදේශවල වගාව සිදු කිරීම - පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම භාවිත කිරීම

(ගැටලු තුනක් නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03
ඒවාට ගත හැකි විසඳුම් දෙකක් යෝජනා කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 02
ලකුණු 05 යි)

Past Papers Wiki

07. (i). ස්වාභාවික නොවන ආපදා දෙකක් නම් කරන්න.

- යුද්ධ
- ත්‍රස්තවාදී ගැටුම්
- අනතුරු (රිය, කාර්මික, පතල්, රසායනික හා විෂ ද්‍රව්‍ය, න්‍යෂ්ටික ආදිය)
- ගොඩනැගිලි කඩා වැටීම් ආදිය

(යනාදි ස්වාභාවික නොවන ආපදා දෙකක් නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)

(ii). නායයෑමක් හඳුනා ගත හැකි පූර්ව ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

- උල්පත්, මඩ උල්පත් හදිසියේ මතු වීම
- කලින් පැවති උල්පත්, දිය පහරවල්, ළිං ආදිය සිදී යාම
- නිවෙස්වල හා විවිධ ගොඩනැගිලිවල පැළුම් ඇති වීම
- අදාළ භූමියේ පැළුම් තල හෝ ගිලා බැසීම් ඇති වීම
- එම ප්‍රදේශවල ඇති ශාක, විදුලි කණු, දුරකථන කණු ආදිය ඇල වීම
- බෑවුම් ඉඩම්වල විශාල ශාක ක්ෂණික ව මැරී යාම
- බෑවුමේ පහළ ප්‍රදේශවල ජල මූලාශ්‍රවල වෙනස් වීම්
- ඇතැම් සතුන්ගේ හැසිරීම් රටා වෙනස් වීම

(යනාදි නායයෑම් පූර්ව ලක්ෂණ තුනක් නිවැරදිව සඳහන් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)

(iii). නායයෑම් ආපදාව අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර, ඉන් එකක් විස්තර කරන්න.

- බෑවුම් ඉඩම්වල ඇති වෘක්ෂලතා වැස්ම ආරක්ෂා කිරීම
- ස්වාභාවික ජලවහනය අවහිර නො කිරීම
- බෑවුම් ඉඩම් පරිහරණයේ දී විද්‍යාත්මක උපදෙස් අනුගමනය කිරීම
- උස් ප්‍රදේශවල ජලාශ ඉදි නො කිරීම
- ශීඝ්‍ර බෑවුම් සහිත ඉඩම්වල ගොඩනැගිලි ඉදි නො කිරීම
- බෑවුම සහිත ඉඩම්වල ස්ථායිතාව ආරක්ෂා වන පරිදි ක්‍රියාමාර්ග ගැනීම
  නිදසුන්: ගල්වැටි, කුට්ටි කාණු, වන වගා යනාදිය
- ප්‍රජාව දැනුවත් කිරීම

(යනාදි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03
ඉන් එකක් විස්තර කිරීමට - ලකුණු 02
ලකුණු 05 යි)

PAST PAPERS WIKI

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

08. (i). (a). දකුණු ඇමරිකා මහාද්වීපයේ ජන සංඛ්‍යාව වැඩි ම රට,
(b). අප්‍රිකා මහාද්වීපයේ ජන සංඛ්‍යාව වැඩි ම රට නම් කරන්න.

(a). දකුණු ඇමරිකා මහාද්වීපයේ ජන සංඛ්‍යාව වැඩි ම රට - බ්‍රසීලය
(b). අප්‍රිකා මහාද්වීපයේ ජන සංඛ්‍යාව වැඩි ම රට - නයිජීරියාව

(රටවල් දෙක නිවැරදිව නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 02 යි)

(ii). ලෝකයේ ජන සංකේන්ද්‍රණ ප්‍රදේශ ආශ්‍රිත ව හඳුනා ගත හැකි පොදු ලක්ෂණ තුනක් දක්වන්න.

- ගංගා නිම්න හා වෙරළබඩ ප්‍රදේශ ආශ්‍රිත ව පිහිටා තිබීම
- මිනිස් වාසයට හිතකර දේශගුණයක් පැවතීම
- සුගමතාවය
- නාගරීකරණය
- වෙළඳාම හා කාර්මීකරණය
- හිතකර භෞතික පරිසරයක් පැවතීම
- කෘෂිකර්මාන්තය සඳහා යෝග්‍ය පරිසරයක් / භෞතික සාධක තිබීම
- වෙළෙඳ හා වරාය පහසුකම් ඇති ප්‍රදේශ වීම
- අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් බහුල වීම
- හොඳ ප්‍රවාහන හා සන්නිවේදන පහසුකම් පැවතීම
- කර්මාන්ත හා රැකියා අවස්ථා බහුල වීම

(යනාදි පොදු ලක්ෂණ තුනක් නිවැරදිව නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි)

(iii). ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධන වේගයේ කාලික පහළ බැසීම නිසා ඇතිවිය හැකි අහිතකර බලපෑම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- වයස්ගත ජනගහනය වැඩි වීම
- ශ්‍රම බලකාය අඩු වීම
- ආර්ථික වර්ධනය මන්දගාමී වීම
- වැඩිහිටි යැපීම් අනුපාතය / වියපත් දර්ශකය ඉහළ යාම
- රාජ්‍ය වියදම් වැඩි වීම
- පාසල් හා ළමා සේවා සඳහා ඉල්ලුම අඩු වීම
- ජනගහන අඩු වීමේ ප්‍රවණතාවක් ඇතිවීම

(යනාදි බලපෑම් තුනක් නිවැරදිව දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 03
එම සඳහන් කරුණු දෙකක්වත් කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 01 බැගින් - ලකුණු 02
ලකුණු 05 යි)

****

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library